(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 236.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 ජනවාරි මස 24 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

124/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ නගර තුළ යාචකයන් විශාල ප්‍රමාණයක් සිටින බවත්;

(ii) ඔවුන්ගෙන් සමහරක් විවිධ සමාජ විරෝධී කටයුතුවලට සම්බන්ධ බවත්;

(iii) ඇතැමුන් යාචක වෙස්ගත් වංචාකාරයන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින යාචකයන් පිළිබඳව සංගණනයක් කර තිබේද; එසේ නම්, එම දිනය කවරේද;

(ii) එම සංගණනයට අනුව ශ්‍රී ලංකාව තුළ සිටින යාචකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව ගැහැණු, පිරිමි හා ළමුන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යාචකයන් පිළිබඳ සංගණනයක් කර නොමැති නම්, සංගණනයක් කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) යාචකයන් පුනරුත්ථාපනයට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව තුළ ඇති යාචක පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුනරුත්ථාපන කටයුතු සඳහා වසරකට රජය වැය කරන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

465/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (9)

(අ) (i) 2015 වසර තුළ ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර කවරේද;

(ii) එකී එක් එක් විදේශ සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, තනතුරු සහ එම පුද්ගලයන් වෙනුවෙන් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1408/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 182 යෝජනාවට අනුව, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් (Primary Industry Council) පිහිටුවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය සහ ස්ථානය කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාවෙහි, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් පිහිටුවීමේ අරමුණු හා ඒ සඳහා වූ වැඩපිළිවෙළ සැකෙවින් පැහැදිලි කරන්නේද;

(iv) මෙම කවුන්සිලයට සම්බන්ධවන විශේෂඥයන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) උක්ත යෝජනාවෙහි සඳහන් වන ශ්‍රී ලංකාවේ දැනට සක්‍රීයව පවත්නා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(vi) 2009 යුද ගැටුම් නිමවීමෙන් පසු, උතුරු නැගෙනහිර ඇතුළුව ශ්‍රී ලංකාව තුළ අළුතින් ඇරඹූ ප්‍රාථමික කර්මාන්තයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1470/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය, ලබාගත් ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1579/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය රජය විසින් චීන ආධාර මත කිතුල්ගල, කළුකොහුතැන්න ප්‍රදේශයේ බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාරය ඉදිකිරීමට පියවර ගන්නා ලද බව දන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා රජයට පවරා ගන්නා ලද ඉහත සඳහන් ග්‍රාමයේ පදිංචිකරුවන්ගේ ඉඩම් සඳහා සුදුසු පරිදි වන්දි ලබාදෙන බවට පොරොන්දු වූ අතර නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ට වන්දි ලබාදුන් නමුත්, කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ට ගෙවා ඇත්තේ ඉතාමත් සුළු වන්දියක් බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් සොයා බලා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ටද ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1617/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ජාතික පාසල් හා පළාත් සභා පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම පාසල් අතරින් සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් කවරේද;

(iv) පසුගිය සමයේ දේශපාලනික හිතවත්කම් මත සුදුසුකම් නොමැති වැඩබලන විදුහල්පතිවරුන් විශාල ප්‍රමාණයක් පත්කර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1638/’17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යුහය තුළ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සඳහා විශේෂයෙන් වගකීම් පැවරූ අංශයක් නොමැති බව දන්නේද;

(ii) පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සඳහා වෙන් වූ විශේෂිත අංශයක් නොමැතිව පුනර්ජනනීය බලශක්ති උපරිම ලෙස ජාතික විදුලි පද්ධතියට එකතු කිරීමේදී මතුවිය හැකි තාක්ෂණික අභියෝග ජය ගත හැකිද;

(iii) පුනර්ජනනීය බලශක්ති පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය දක්වන පසුගාමී ආකල්පයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1983/’17

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බේරුවල ප්‍රාදේශීය සභාවට අයත් අළුත්ගම මහජන ක්‍රීඩාංගණය එම සභාව මඟින් නඩත්තු කරන බවත්;

(ii) මීට වසරකට පෙර එම ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කර සංවර්ධනය කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය සහ වර්ෂය කවරේද;

(ii) ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(v) ව්‍යාපෘතිය සඳහා අනුමත වූ සම්පූර්ණ මුදලම එම ව්‍යාපෘතියට යොදවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ක්‍රීඩාංගණය, උත්සවයක්/ක්‍රීඩා තරඟයක්/සාමාජීය කටයුත්තක් සඳහා වෙන් කර ගැනීමේදී බේරුවල ප්‍රාදේශීය සභාවෙන් අවසර ගැනීම සඳහා එම ප්‍රදේශය නියෝජනය කරන අමාත්‍යවරයාගේ නිර්දේශය අවශ්‍ය වන්නේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ප්‍රදේශයේ ක්‍රීඩා සමාජවලට මෙම ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කිරීම තහනම් කර තිබේද;

(iv) එසේ නම්, එයට පදනම් වූ හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2108/’17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, තෙන්මරාච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පසුගිය වර්ෂයේදී විවිධ නිවාස යෝජනා ක්‍රම යටතේ ඉදිකර සම්පූර්ණ කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සියල්ලම අදාළ ප්‍රතිලාභීන්ට ලබාදී තිබේද;

(iii) අදාළ ප්‍රතිලාභීන් එම නිවෙස්වල පදිංචිව සිටින්නේද;

(iv) මෙතෙක් ලබාදී ඇති නිවාසවල පදිංචි වී නොසිටින ප්‍රතිලාභීන්ට ඒවායේ පදිංචි වීම සඳහා නිශ්චිත කාල වකවානුවක් ලබාදී, එම කාලය තුළදී ද අදාළ පුද්ගලයන් එම නිවාසවල පදිංචි නොවුනහොත්, එම නිවාස, නිවාස අවශ්‍යතා ඇති වෙනත් ප්‍රතිලාභීන්ට ලබා දීමට කටයුතු කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2123/’17

ගරු ජයන්ත සමරවීර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.05.27 දින ඇතිවූ ගංවතුර හා නායයෑමේ ආපදා තත්ත්වයෙන් කළුතර දිස්ත්‍රික්කයේ පූර්ණ, අර්ධ හා සුළු වශයෙන් හානි වූ නිවාස, වැසිකිලි සහ පානීය ළිං සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ පූර්ණ හානි වූ නිවසක්, වැසිකිලියක් හා ළිඳක් නැවත ඉදිකිරීමට සහ අර්ධ හා සුළු හානි වූ නිවාස, වැසිකිලි හා පානීය ළිං ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජයෙන් ලබාදෙනු ලබන්නේ, ආධාර මුදලක්ද නැතහොත් ණය මුදලක්ද යන්නත් එම ආධාර හෝ ණය මුදල කොපමණද;

(iv) මේ වනවිට ආධාර හෝ ණය ලබා දී තිබෙන පූර්ණ, අර්ධ හා සුළු වශයෙන් හානි වූ නිවාස වැසිකිලි හා පානීය ළිං සංඛ්‍යාව කොපමණද;

(v) එසේ ආධාර හෝ ණය ලබා දී ඇති පවුල්වල නම, ලිපිනය, ග්‍රාම නිලධාරි වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2128/’17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 288, ශ්‍රී ජයවර්ධනපුර පාර, කෝට්ටේ, රාජගිරිය දරන ස්ථානයේ පිහිටි උපාලි ජයසිංහ මහතාට අයත් DPJ නමැති ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතිය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, අනුමතිය ලබාගෙන ඇති දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපත් කළ කොන්දේසි කවරේද;

(iv) ඒවා ඉටුකර තිබේද;

(v) එසේ නොවේ නම්, අදාළ ආයතනයට එරෙහිව නාගරික සංවර්ධන අධිකාරිය ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2146/’17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංකාවේ බිත්තර පරිභෝජනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම අවශ්‍යතාවය සපුරා ගන්නා ආකාරය කවරේද;

(iii) ලංකාවේ දේශීය බිත්තර නිෂ්පාදනය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වයඹ පළාතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල ජනතාවගෙන් සැළකිය යුතු පිරිසක් බිත්තර නිෂ්පාදනයේ නිරත වී සිටින බැවින්, ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2281/’17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ කිහිපය තුළ මෙරට කසිප්පු භාවිතය වාර්ෂිකව වැඩි වී තිබේද;

(ii) සිදු කරනු ලබන කසිප්පු වැටලීම් සංඛ්‍යාව මේ වනවිට අඩු කර තිබේද;

(iii) 2015, 2016 වර්ෂවලදී සහ 2017 මුල් මාස 06 තුළ වටලන ලද කසිප්පු විකුණන ස්ථාන සංඛ්‍යාව සහ අත්අඩංගුවට ගත් කසිප්පු ලීටර් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙරට කසිප්පු නිෂ්පාදනය වැළැක්වීමට අමාත්‍යාංශය ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2455/17

ගරු තාරක බාලසූරිය මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කය තුළ කටුපොල් වගා කර ඇති ඉඩම් ප්‍රමාණය ආසන්න වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ කටුපොල් වගාව ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය කවරේද;

(iii) කටුපොල් වගාවත්, ජල ධාරණය සහ පාංශු භායනයත් අතර සහසම්බන්ධතාවයක් ඇති බවට අමාත්‍යාංශය විසින් හඳුනාගනු ලැබ තිබේද;

(iv) එසේ නම්, මේ වනවිට ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2458/’17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1972 වර්ෂයේදී ආරම්භ කරන ලද පදවිය ග්‍රාමීය රෝහල මේ වනවිට කිසිදු පහසුකමක් නොමැති කමින් මධ්‍යම බෙහෙත් ශාලාවක් බවට පත්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම රෝහල යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන් වුවද, 2018 පෙබරවාරි 19 වැනි සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු අතර එදින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.00 සිට අ. භා. 12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2018 පෙබරවාරි මස 19 වැනි සඳුදා පූ. භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017දෙසැම්බර් 11) [1].

*3.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017දෙසැම්බර් 11) [1].

*4.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව,— සලකා බැලීම.

*5.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත අනුමත කළ යුතුය.

*6.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝගය,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 18 දිනැති අංක 2032/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.12.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*11.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් ස්ථාපිත මෙම කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හා දීමනා එකී පනතේ 4(8) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු හෙයින්ද;

2017.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික සහ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා පහත පරිදි ප්‍රතිශෝධනය කිරීමට අනුමතිය ලබා දී ඇති හෙයින් ද;

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට පිළිවෙළින් රු. 75,000/-ක් සහ රු. 60,000/-ක් වශයෙන් මාසික පාරිශ්‍රමිකයන් ගෙවීමටත්;

(ii) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට එක් රැස්වීම් වාරයක් සඳහා රු. 6,000/-ක දීමනාවක් ගෙවීමටත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 (iv)හි විධිවිධාන පරිදි සභාපතිවරයා සඳහා ලීටර් 225ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් සහ උප සභාපතිවරයා සඳහා ලීටර් 170ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් ලබා දීමටත්;

ඊට අනුකූලව, 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාට, උප සභාපතිවරයාට සහ සාමාජිකයන් වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පාරිශ්‍රමික හා දීමනා ගෙවනු ලැබීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*13.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

18.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---